# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 57 — 1973 අප්‍රේල් 27 වැනි සිකුරාද — 1973.04.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අගත් එක් එක් භාගාවටම වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| පනත් ... — ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් මහාධිකරණයේ දන්වීම — ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දන්වීම ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු හැසි පිළිබඳ නිවේදන ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දන්වීම ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දන්වීම ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම — ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දන්වීම — ... | 71 |
| මුදල් නඩු පිළිබඳ දන්වීම ... — ... | 72 |
| නීති අධ්‍යාපන සභාවේ දන්වීම ... — ... | — |
| නොතාරිස් ලැයිස්තුව — — ... | — |
| විවිධ දන්වීම ... — — — | — |


## පිස්කල් විකිණීම් පිළිබඳ දන්වීම්

### බස්නාහිර පළාත

**පානදුර දිස්ත්‍රික් උසාවියේ දීය**

කොළඹ 10, ශ්‍රී සංඝරාජ මාවත, අංක 23/1 දරණ "පවන" හි පදිංචි රුවන්පුර ණයනවත්ද ද සිල්වා..............පැමිණිලිකාරයා.

නොම්මරය : 1639/ල. එදිරිව

(1) මොරටුව, මෝල්පෙ, ද සොයිසා පාරේ අංක 334 හි පදිංචි වර්ණපුරගේ ඇඩ්ලින් fප්‍රනාන්දු, (2) එහි පදිංචි දෙවපුරගේ කෙප්ටර් කමලසිරි fප්‍රනාන්දු, (3) එහි පදිංචි දේවපුරගේ පර්සින් බර්නට් මලලසිරි fප්‍රනාන්දු නොහොත් දේවපුරගේ පර්සි බර්නට් මලලසිරි fප්‍රනාන්දු, (4) එහි පදිංචි දේවපුරගේ හෙක්ටර් හේමසිරි fප්‍රනාන්දු ....................විත්තිකරුවන්.

මෙහි පහත සඳහන් වෙන දේපල වර්ෂ 1973 මැයි මස 24 දින පෙ. ව. 10.30 ට ඉඩම පිහිටි ස්ථානයේදී වර්ෂ 1972 ක්වූ නොවැම්බර් මස 29 වෙනි දින දරණ විකිණීමේ නියෝගය අනුව විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවීමට නියමිවූ රුපියල් විසි එක් දහස් තුන්සියයක් (රු. 21,300) සහ වර්ෂ 1968 ක්වූ දෙසැම්බර් මස 3 වැනි දින සිට 1972 ක්වූ අගෝස්තු මස 9 වැනි දින වනතෙක් රු. 15,000 ට සියයට දහහතර බැගින් අවුරුද්දට පොලියද, 1972. 8. 9 වැනි දින සිට මුළු එකතුවූ මුදල අයකර ගන්නාතෙක් ඊට පොලීය අවුරුද්දට සියයට පහ බැගින්ද, ශ්‍රේෂ්ඨාධිකරණයේ ගාස්තු බිලෙන් අයවිය යුතුවූ හිඟ මුදලවූ රු. 6.33 ද සහ දිස්ත්‍රික් උසාවියේ නඩු ගාස්තුව වූ රු. 2,472/81 ද අයකර ගැනීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සීමාව තුල වැල්ලවත්තේ පිහිටි උතුරට 231 ඒ 2 කට්ටියද, නැගෙනහිරට 231 සී 2 කට්ටිය ද, දකුණට 231 සී 2 කට්ටියද සහ බස්නාහිරට 231 බී 1 කට්ටිය ද මායිම්වූ පර්චස් තුනයි දශම අටයි හතක අ. 0, රූ. 0, ප. 3.87 ප්‍රමාණයෙන් ඇති වැල්ලවත්තේ 47/213 හි ලියාපදිංචි කරන ලද කොරපොල්පිටිය වත්ත කියන ඉඩමේ අංක 2 දරණ ලියාපදිංචි කිරීමේ පිඹුරේ පෙනෙන 231 බී 2 වශයෙන් ලකුණු කොට ඇති මුළු ඉඩම් කට්ටිය හා එහි තුළ තිබෙන වැල්ලවත්තේ ගාලු පාරේ කලින් වරිපනම් අංක 459/380 ඒ දැරූ, පසුව අංක 173 හා 175 සහ දැනට ගාලු පාරේ අංක 241 හා 243 දරණ ගොඩනැගිලි ද වේ.

එකී ඉඩම් කට්ටිය සහ දේපල වනාහි, බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ වැල්ලවත්තේ පිහිටි උතුරට 231 ඒ කට්ටියද , නැගෙනහිරට 231 සී කට්ටිය ද, දකුණට 231 සී කට්ටිය ද, බස්නාහිරට කොළඹ සිට ගාල්ලට යන මහ පාරද මායිම් වූ ජේ. පී. මැලෝනි බලයලත් මිනින්දෝරු තැන විසින් සකස් කරන ලද අංක 378 හා 1938 ජූනි 8 දින දරණ සැලැස්ම අනුව පර්චස් හතරක අ 0, රූ. 0, ප. 4 ප්‍රමාණයෙන් ඇති කොරපොල්පිටිය වත්ත කියන ඉඩමේ අංක 2 දරණ ලියා පදිංචි කිරීමේ සැලැස්මේ 231 කට්ටියේ 231 බී වශයෙන් ලකුණු කොට ඇති මුළු ඉඩම් කට්ටියෙන් හා එහි තිබෙන වැල්ලවත්තේ ගාලු පාරේ කලින් වරිපනම් අංක 459/380 ඒ දැරූ, පසුව 173 හා 175 ද, දැනට ගාලු පාරේ අංක 241 හා 243 දරණ ගොඩනැගිලිවලින් රජය විසින් අත්පත් කර ගනු ලැබූ පසු, ඉතිව තිබෙන ප්‍රමාණය වේ.

ඩබ්ලිව්. ජේ. ඩයස්,
කොළඹ නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 1973 අප්‍රේල් 10,
කො ඹ පිස්කල් කන්තෝරුවේ.

4–718—73.04.27 දින අංක 57 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පලකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පලකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දන්වීම් භාරගනු නොලැබේ.

1972 ජනවාරි මස 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

### නයිසයි ආඥාවයි

මාතර දිස්ත්‍රික් උසාවියේ දීය

මාතර රාහුල පාරේ පදිංචිව සිට නැසීගිය, ලීලාවතී විජේකෝන් මහත්මියගේ අන්තිම කැමති පත්‍රය සහ තෙස්තමේන්තුව පිළිබඳ කාරණාව ගැනයි.

කොළඹ, රැජින පාරේ අංක 5, සාල්ටුන් හි පදිංචි ශාන්ති වෙන්කත දිසානායක .................................. පෙත්සම්කාරිය

බූදල් නඩු අංකය: ටී. 5293 එදිරිව

(1) කොළඹ, රැජින පාරේ අංක 5 සාල්ටුන් හි පදිංචි මද්දු මාගේ අජිතා විජේකෝන් දිසානායක, (2) මාතර අකුරු ගොඩ පදිංචි, එඩ්වින් විජේකෝන් .............. වගඋත්තරකරුවෝ

පෙත්සම්කාරිය වෙනුවෙන් පෙනී සිටින නීතිඥ ඒ. ඊ. බුල්ජන්ස් මහතා සහ ඔහුගේ සහායක නීතිඥ ආර්. එල්. වී. ද සිල්වා මහතා පෙනී සිටියදී වෂී 1973 ක්වූ පෙබරවාරි මස 19 වන දින මෙම කාරණය ගැන සුදුස්සක් කිරීමට මාතර දිස්ත්‍රික් විනිශ්චයකාර තැන්පත් ජේ. එෆ්. ඒ. සෝසා මැතිතුමා ඉදිරියට පමුණුවන ලදුව පෙත්සම්කාරියගේ 1973 පෙබරවාරි 15 දින දරණ දිවුරුම් ප්‍රකාශයද, සාක්ෂිකරුවන්ගේ 1973 පෙබරවාරි 15 වන දින දරණ දිවුරුම් ප්‍රකාශ දෙක ද කියවා බැලීමෙන් පසු:

ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් විසින් හෝ මෙම කාරණාව ගැන උනන්දුවක් දක්වන වෙනත් අයෙකු විසින් හෝ මෙම අධිකරණය සෑහීමට පත්වන අයුරු විරුද්ධ කාරණා 1973 මැයි මස 25 වන දිනට පෙර නොදැක්වුවහොත් මෙම නඩුවෙයි වැඩ කටයුතු සම්බන්ධයෙන් බාලවයස්කාර පළමුවැනි වගඋත්තර කරුගේ භාරකරු ලෙස ඉහත කී දෙවන වගඋත්තරකරු පත් කරන බවත් එසේ පත්කළ බවත් මෙයින් නියෝගකර ප්‍රකාශ කරනු ලැබේ. තවද, එම බාලවයස්කාර 1 වන වගඋත්තරකරු ඒදින මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් කළ යුතු බවත් මෙයින් නියෝග කරනු ලැබේ.

ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් විසින් හෝ මෙම කාරණාව සම්බන්ධව උනන්දුවක් දක්වන වෙනත් අයෙකු විසින් හෝ මෙම අධිකරණය සෑහීමට පත්වන අයුරු විරුද්ධ කාරණා 1973 මැයි මස 25 වන දිනට පෙර ඉදිරිපත් නොකළහොත් දිනට මෙම අධිකරණයෙහි තැන්පත්කොට ඇති 1972 පෙබරවාරි මස 26 වන දින දරණ එකී නැසීගිය ලීලාවතී විජේකෝන් ගේ අන්තිම කැමති පත්‍රය ඔප්පුවූ බවද, ඔප්පුවූ බව මෙයින් ප්‍රකාශ කරන බවද මෙයින් නියෝගකර ප්‍රකාශ කරනු ලැබේ.

තවද, එකී අන්තිම කැමති පත්‍රයෙහි නම් කරන ලද බූදල් බල කාරිය එකී පෙත්සම්කාරිය බව ද, ඒ අනුව අන්තිම කැමති බල පත්‍රය තමන් වෙත නිකුත් කරවා ගැනීමට ඇයට හිමිකම් ඇති බවද ඒ අනුව එම බූදලයේ අන්තිම කැමති බලපත්‍රය ඇය වෙත නිකුත් කරන බව ද මෙයින් වැඩිදුරටත් ප්‍රකාශ කරනු ලැබේ.

ජේ. එෆ්. ඒ. සෝසා,
දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.

1973 පෙබරවාරි මස 19 වන දින දී.

4–710—73.04.27 දින අංක 57 දරන ගැසට් පත්‍රය

---

### නයිසයි ආඥාවයි

අන්තිම කැමති පත්‍රයක් නොමැති මියගිය පී. ඒ. ගුණවර්ධනගේ බූදලය පිළිබඳ කාරණාව ගැනයි.

මාතර, පොල්හේනේ පදිංචි ජූලියා පෙරේරා ගුණවර්ධන .................................................. පෙත්සම්කාරිය.

බූදල් නඩු අංක ටී/5274. එදිරිව

(1) පොල්හේනේ පදිංචි පාලිත අබේසිංහ ගුණවර්ධන, (2) පොල්හේනේ පදිංචි ගුණවතී අබේසිංහ ගුණවර්ධන, (3) පොල්හේනේ පදිංචි එමී ලූසේ කරා අබේසිංහ ගුණවර්ධන (4) පොල්හේනේ/ඇනුට සාප්තේ ඇමතක් හිල් සිරගෙදර පණ්ඩිත්සේකර අබේසිංහ ගුණවර්ධන, (5) කොල්ලුපිටියේ ඊත්ලත් පෙන්දසේ අංක 25 හේ පදිංචි සුසිලා අබේසිංහ ගුණවර්ධන, (6) සීදූව, හෙල්ටන් හි පදිංචි බන්දුල අබේසිංහ ගුණවර්ධන, (7) පොල්හේනේ පදිංචි ඉන්ද්‍රානි අබේසිංහ ගුණවර්ධන .................................. වගඋත්තරකාරයෝ

පෙත්සම්කාරිය වෙනුවෙන් පෙනී සිටිය ෂෙල්ටන් ඩයස් සහ පුවලසිරි විජේරත්න නීතිඥ මහතුන් පෙනී සිටියදී වෂී 1972 ක්වූ ඔක්තෝබර් මස 12 වෙනි දින මෙම කාරණය ගැන සුදුස්සක් කිරීමට මාතර දිස්ත්‍රික් නඩුකාර තැන්පත් ජේ. ඇෆ්. ඒ. සෝසා මැතිතුමා ඉදිරියට ඉදිරිපත් කරන ලදුව පෙත්සම්කාරියගේ 1972 ක්වූ ජූලි මස 6 වෙනි දින දරණ දිව්රුම් ප්‍රකාශයද කියවා බැලීමෙන් පසු:

ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් විසින් හෝ මෙම කාරණාව සම්බන්ධව උනන්දුවක් දක්වන වෙනත් අයවලුන් විසින් හෝ මෙම අධිකරණය සෑහීමට පත්වන අයුරු ප්‍රතිවිරුද්ධව කරුණු 1973 ක්වූ මාර්තු මස 9 වෙනි දිනට හෝ ඊට පෙර හෝ නොදැක්වුවහොත්, නැසීගිය අයගේ වැන්දඹු භායීාව වශයෙන් ඉහත නම් සඳහන් පෙත්සම්කාරියට එම නැසීගිය අයගේ බූදලය හා දේපල පරිපාලන කිරීමේ බූදල් පරිපාලන බල පත්‍රය නිකුත් කරවා ගැනීමට හිමිකම් ඇති බවද එම බූදල් පරිපාලන බලපත්‍රය නිකුත් කරන බවද මෙයින් ප්‍රකාශ කරන බව ආඥාකරණු ලැබේ.

ජේ. ඇෆ්. ඒ. සෝසා,
දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.

1972 ක්වූ ඔක්තෝබර් මස 12 වන දින දීය.

සකස් කලේ—
ෂෙල්ටන් ඩයස් සහ පුවලසිරි විජේරත්න,
පෙත්සම්කාරියගේ නීතිඥවරු.

කරුණු දැක්වීමේ දිනය 1973 ක්වූ ජූනි මස 22 දිනට දීර්ඝ කරන ලදී.

ජේ. ඇෆ්. ඒ. සෝසා,
දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.

1973.3.9

4–711—73.04.27 දින අංක 57 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| අප්‍රේල් | ... | 73.04.19 බ්‍රහස්පතින්ද | ... | 73.04.11 බදද | දවල් 12.00 |
| | | 73.04.27 සිකුරාද | ... | 73.04.19 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| මැයි | ... | 73.05.04 සිකුරාද | ... | 73.04.27 සිකුරාද | දවල් 12.00 |
| | | 73.05.11 සිකුරාද | ... | 73.05.04 සිකුරාද | දවල් 12.00 |
| | | 73.05.18 සිකුරාද | ... | 73.05.11 සිකුරාද | දවල් 12.00 |
| | | 73.05.25 සිකුරාද | ... | 73.05.18 සිකුරාද | දවල් 12.00, |
| ජූනි | ... | 73.06.01 සිකුරාද | ... | 73.05.25 සිකුරාද | දවල් 12.00 |
| | | 73.06.08 සිකුරාද | ... | 73.06.01 සිකුරාද | දවල් 12.00 |
| | | 73.06.14 බ්‍රහස්පතින්ද | ... | 73.06.08 සිකුරාද | දවල් 12.00 |
| | | 73.06.22 සිකුරාද | ... | 73.06.14 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | | 73.06.29 සිකුරාද | ... | 73.06.22 සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.